# <u>දැන්වීමයි</u>

**ප්‍රධාන විනය පාලක තනතුර සහ උප විනය පාලක තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය විනය පිළිබඳ 2026 අංක 01 දරණ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රධාන විනය පාලක තනතුර සහ උප විනය පාලක තනතුරුවල ධූර කාලය එක් අධ්‍යයන වර්ෂයක් සඳහා වන අතර ඒ අනුව 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

ප්‍රධාන විනය පාලක තනතුර සහ උප විනය පාලක තනතුරු සඳහා සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

ප්‍රධාන විනය පාලක සහ උප විනය පාලකවරු විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ උපදෙස් වලට අනුකූලව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ විනය භාරව කටයුතු කළ යුතුය (විනය පාලක සහ උප විනය පාලකගේ බලතල, කාර්යය සහ කර්තව්‍යය ශිෂ්‍ය විනය පිළිබඳ 2026 අංක 01 දරණ අතුරු ව්‍යවස්ථාවේ 4.3 සහ 4.4 හි සඳහන් වේ).

<u>මූලික සුදුසුකම්</u>

**ප්‍රධාන විනය පාලක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I වන ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක ආචාර්යවරයෙකු වීම.**

**උප විනය පාලක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක ආචාර්යවරයෙකු වීම.**

<u>තෝරාගැනීමේදී පහත සුදුසුකම් සැලකිල්ලට ගනු ලැබේ.</u>

1. ප්‍රධාන විනය පාලක තනතුර සඳහා පීඨාධිපති/ අධ්‍යයනාංශ ප්‍රධාන තනතුරක සේවා පළපුරුද්ද ද උප විනය පාලක තනතුර සඳහා අධ්‍යයනාංශ ප්‍රධාන තනතුරක සේවා පළපුරුද්ද
2. විශ්වවිද්‍යාලයේ වෙනත් පරිපාලන තනතුරුවල සේවා පළපුරුද්ද
3. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/ ශිෂ්‍ය උපදේශක තනතුරක සේවා පළපුරුද්ද
4. නේවාසිකාගාර පාලක/ නේවාසිකාගාර උප පාලක (අධ්‍යයන) තනතුරක පළපුරුද්ද

ප්‍රධාන විනය පාලක සහ උප විනය පාලක තනතුරු සඳහා අයදුම්පත් ස්වකීය සවිස්තරාත්මක ජීවදත්ත පත්‍රිකාවක් සහිතව 2026.02.20 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය වෙත ගෙනැවිත් භාර දීමට කටයුතු කරන්න.

මහාචාර්ය රෝහාන් නෙත්සිංහ

උපකුලපති

2026.02.02

මහාචාර්ය රෝහාන් නෙත්සිංහ
උපකුලපති
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07.
ශ්‍රී ලංකාව.